## අධිකරණ සේවා කොමිෂන් සභාව

### පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සභාපති හා සාමාජික තනතුරු

01. 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනත මගින් සංස්ථාපිත පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සභාපති තනතුර (01) හා සාමාජික තනතුර (01) සඳහා අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත. සියලුම අයදුම්පත් එම අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2024.07.25 දින හෝ ඊට පෙර අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.

02. සුදුසුකම් :

(අ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට රාජ්‍ය නිලධරයෙකු වශයෙන් අවුරුදු 20කට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන්;

*හෝ,*

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නීතිඥ වෘත්තියේ අවුරුදු 10කට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන්.

03. **සභාපති තනතුර සඳහා ගෙවනු ලබන දීමනා පහත පරිදි වේ.**

| | | |
|---|---|---|
| * මාසික පාරිශ්‍රමිකය | - | රු. 135,000 |
| * මාසික ප්‍රවාහන දීමනාව | - | නිල වාහනයක් හෝ නිල රථ දීමනාවක් (කොන්දේසි අදාළයි) |
| * ඉන්ධන දීමනාව | - | (මාසික) වෙළඳපොළෙහි පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූප ව ඉන්ධන ලීටර 220ක දීමනාවක් |
| * දුරකථන දීමනාව | - | රු. 10,000 (මාසිකව) |

04. **සාමාජිකයෙකුට ගෙවනු ලබන දීමනා පහත පරිදි වේ.**

| | | |
|---|---|---|
| * මාසික පාරිශ්‍රමිකය | - | රු. 90,000 |
| * මාසික ප්‍රවාහන දීමනාව | - | පදිංචි ස්ථානයේ සිට කි. මී. 350 දක්වා රු. 25,000, කි. මී. 350 ඉක්මවන විට රු. 50,000 ක මාසික දීමනාව |
| * දුරකථන දීමනාව | - | රු. 8,000 (මාසිකව) |

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2024 ජූලි මස 05 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

07-370

